# ශ්‍රී ලංකාවේ නිර්මාණය කළ පළමු වැනි බුද්ධ ප්‍රතිමාව උරුසිලා පටිමාව ද?

එස්.ආර්.ඩී. හර්ෂනි

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
dilshaharshanisr@gmail.com

**මුඛ්‍ය පද -** ශ්‍රී ලංකාවේ, නිර්මාණය, බුද්ධ ප්‍රතිමාව, උරුසිලා පටිමාව,

## හැඳින්වීම

මෙරට නිර්මාණය කරන ලද පළමු වැනි බුදුපිළිමය වන දේවානම්පියතිස්ස රජතුමා විසින් කළා යැයි සඳහන් වන උරුසිලා පටිමාව නම් ප්‍රතිමාව පිළිබඳව මහාවංශ කතුවරයා විවිධ අවස්ථාවලදී වර්ණනාවට ලක් කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. මහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් නිර්මාණය වූ උරුසිලා පටිමාව මහසෙන් රජුගේ (ක්‍රි.ව. 276-303) කාලයේ දී අභයගිරි විහාරයට ගෙන ඒමත් සමග එය අභයගිරි විහාරික ප්‍රතිමාවක් ලෙස එතැන් සිට ඓතිහාසික වර්ණනාවට ලක්වන්නට විය. අනුරාධපුර යුගයේ අග භාගය වන විට අභයගිරි විහාරය, මහාවිහාරය හා ජේතවන විහාරය යන ප්‍රධාන නිකාය ත්‍රිත්වයටම අයත් ආරාම තුනෙහිම "සල පිළිමය" නමින් හැඳින්වූ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවක් පැවති බව පෙනේ. සිව්වන කස්සප රජු තුන් නිකායට අයත් සල පිළිමවල රන්මුවා රැස් වළලු, කුඩය, සිළුමිණ යන කර්මාන්ත කරවා ඇත. පුජාවලියේ දී කසුප් මහරජ තුන් නිකායේ සල පිළිමයන්ට රන් සේසත් කරන ලද බව දක්වයි. සිව්වන මහින්ද රජුගේ දඹේගොඩ ටැම් ලිපියේ ද තුන් නිකායේ ම පැවති සල පිළිමයන් පිළිබඳව සඳහන් වේ. තුන් නිකායේම සල බුදුපිළිම අතුරෙන් පැරණිතම පිළිමය වූයේ දේවානම්පියතිස්ස රජු කර වූ පසුව අභයගිරි විහාරයට ගෙන එන ලද උරුසිලා පටිමාවයි. මෙම ප්‍රතිමාව උරුසිලා පටිමා, මහසිලා පටිමා, සිලාසත්ථු, සිලා සම්බුද්ධ හා සිලා මුනින්දා යන නම්වලින් ද හඳුන්වා ඇත. කෙසේ නමුදු උරුසිලා පටිමාව යනු සුප්‍රසිද්ධ සමාධි පිළිමය යැයි යන අදහස (සෝමපාල, 1996) බොහෝ දෙනා ගෙන එන අතර ඒ පිළිබඳ ඉදිරිපත් වී ඇති ඓතිහාසික සාධකයන් ලෙස පාහියන් හිමිගේ දේශාටන වාර්තාව මූලික වේ. ඒ අනුව පර්යේෂණ ගැටලුව වනුයේ දෙස් විදෙස් බෞද්ධයන් හා සෞන්දර්යවාදීන් අතර ඉතා ප්‍රචලිත අනුරාධපුරයේ පැරණි නගරයේ වැඩ හිඳින සුප්‍රසිද්ධ සමාධි පිළිම වහන්සේ වනාහි මෙරට නිර්මාණය වූ පළමු බුද්ධ ප්‍රතිමාව එනම් දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන්නට යෙදුන උරුසිලා පටිමාව දැයි විමර්ශනය කිරීම වේ.

## ක්‍රමවේදය

මෙහි දී මා දත්ත රැස් කිරීම සඳහා ද්විතියික මූලාශ්‍ර යොදා ගන්නා ලදී. එහි දී පුස්තකාල අධීක්ෂණය යටතේ විවිධ පොත්පත් පරිශීලනය ඔස්සේ කරුණු අධ්‍යයනය කරන ලදී. එමෙන් ම අන්තර්ජාලය පරිශීලනය කරමින් ද තවදුරටත් දත්ත ලබා ගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පාහියන් හිමි අභයගිරියේ දී දකිනුයේ සුප්‍රසිද්ධ සමාධි ප්‍රතිමාව බවට මත ඇත (සෝමපාල, 1996). මෙරටට පැමිණෙන පාහියන් හිමියන් අභයගිරියේ දී දකිනුයේ පිළිම ගෙයක් සහිත පිළිමයකි. ඇතැම් විද්වතුන් පෙන්වා දෙන්නේ පාහියන් හිමි දුටු එම පිළිමගේ ධාතුසේන රජු විසින් අභයගිරි විහාරයේ සල පිළිමයට කරන ලද පිළිම ගෙය විය හැකි බවයි. පාහියන් හිමි මෙරටට පැමිණෙන ලද්දේ ක්‍රි.ව. 411 දී වන අතර මහාවංශයට අනුව අභයගිරි විහාරයේ සල පිළිමයට ප්‍රථම වරට පිළිමගෙයක් ඉදි කරනුයේ ධාතුසේන රජුය (වික්‍රමගේ, 1964). එනම් පාහියන් හිමි අභයගිරි විහාරයට පැමිණීමෙන් අඩසිය වසකට පමණ පසුවය. එබැවින් පාහියන් හිමි සඳහන් කරනුයේ සුප්‍රසිද්ධ සමාධි පිළිමය පිළිබඳව නොව අභයගිරි විහාරයේ වූ වෙනත් පිළිමයක් පිළිබඳව බව පැහැදිලි වේ. ක්‍රි.ව. 9-10 සියවස්වලට අයත් ශිලාලේඛන

රූසක් අභයගිරි විහාරයේ තිබූ සල පිළිමෙ පිළිබඳව සඳහන් කරයි. එහිදී හතරවෙනි කස්සප රජුගේ පොළොන්නරු රජ මාළිගා ටැම් ලිපිය, එම රජුගේම පොළොන්නරු බටහිර දොරටු ටැම්ලිපිය, පස්වැනි කස්සප රජුගේ කුඹුක් වැව ටැම් ලිපිය, හතරවන මහින්ද රජුගේ රඹෑව පුවරු ලිපිය වැදගත් විය. සාහිත්‍ය මූලාශ්‍ර වල හා ශිලා ලේඛනයන්හි සඳහන් තොරතුරු අනුව අභයගිරි විහාරයේ සල බුදු පිළිමය හිටි පිළිමයක් ද නැතහොත් හිඳි බුදු පිළිමයක් ද යන්න ඉන් මනාව පැහැදිලි කර ගන්නා ලදී. අභයගිරිය තැන්පත් කර තිබූ මහාවංශයේ පුනපුනා වර්ණනාවට ලක්කරන සමාධි පිළිමය යනු නූතන සුප්‍රසිද්ධ සමාධි පිළිමය ද යන්න පිළිබඳ සෙවීමේදී පුරාවිද්‍යාත්මක සාධක ඉවහල් විය. අභයගිරි විහාරයෙන් දැනට බෝධිඝර පහක නටබුන් සොයාගෙන ඇති අතර පැරණිතම බෝධිඝරය, දෙවැනි සමාධිය යනුවෙන් ජනවහර දැක්වෙන බෝධිඝරය, සුප්‍රසිද්ධ සමාධි බුදු පිළිමය පිහිටි බෝධිඝරය, කුට්ටම් පොකුණට උතුරින් කපාරාරාමයේ ඇති විශේෂ හැඩයකින් යුතු බෝධිඝරය හා ලංකාරාම බෝධිඝරය ඒවා වේ. එහිදී 1962 වසරේදී ආචාර්ය සී.ඊ. ගොඩකුඹුර විසින් අභයගිරියේ ආසනඝරය යනුවෙන් හඳුන්වා දුන් එයින් ඉපැරණි බෝධිඝරය කැණීම් කිරීමේදී හිඳි පිළිමයක් ලැබී ඇති අතර වර්තමානයේ එය අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ 184 ලියාපදිංචි අංකය යටතේ තැන්පත් කර ඇත. එම පිළිමය සොයා ගන්නා සොයා ගන්නා අවස්ථාවේදී ගල් ආසනයකට යටවී තිබී ඇති බව හෙළි විය. එම සමාධි පිළිමයේ ලක්ෂණ විග්‍රහ කරන නන්දදේව විජේසේකර මේ මථුරා දේශයෙන් ගෙනෙන ලද්දක් බව අනුමාන කර ඇත. එසේම මෙම පිළිමයේ මුහුණ හා ශරීරය මෞර්ය යුගයටත් පෙර සිටි ඉන්දියාවේ දේශීය කලාවේ යක්ෂ රූප මෙන් බව ද මෙම බුදු පිළිමය දේවානම්පියතිස්ස රජු දවස මෙරටට පැමිණි ඉන්දියානු දේශීය කලා සම්ප්‍රදායට අයත් ශිල්පීන් අතින් ලංකාවට උචිත පරිදි නිර්මාණය කරන ලද්දක් හෝ ඔවුන් විසින් පුහුණු කරනු ලැබූ මෙරට දේශීය ශිල්පීන් අතින් නිර්මාණය කරන ලද්දක් බවද මත පළ වී ඇත. අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මෙම ප්‍රතිමාව අභයගිරියේ පමණක් නොව ශ්‍රී ලංකාවේ ද ඇති අති පැරණි ප්‍රතිමාව ලෙස  කරුණු මතුවිය. එසේම මෙම පර්යේෂණයේ දී පිළිමයේ නේත්‍රා වටිනා ගල්වලින් සරසා ඇතත් අද ඒවා දක්නට නොමැති බව ද හෙළිවිය. එසේම ප්‍රතිමාවේ වැදගත්කම නිසා වරින්වර ප්‍රතිමාව පිළිසකර කරමින් වර්ණ ගන්වමින් පවත්වාගෙන ආ බවට එහි ශේෂ වී ඇති ලක්ෂණ සාක්ෂි දරන බව හා මෙම ප්‍රථිමාව තැන්පත් කර තිබී ඇත්තේ අභයගිරි විහාරයේ පැරණිතම බෝධිඝරයේ වීම ද අවධාරණය විය.

පුරාවිද්‍යාසාධක මත පදනම්ව  ඒ අනුව උරුසිලා පටිමා නමින් වංශ කතාවේ නම් කරන මෙරට පැරණිතම ප්‍රතිමාව සුප්‍රසිද්ධ සමාධි ප්‍රතිමාව නොව අනුරාධපුර පුරාවිද්‍යා පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ප්‍රතිමාව බවත් සුප්‍රසිද්ධ සමාධි පිළිමය යනු මෙරට නිර්මාණය වූ පළමු බුද්ධ ප්‍රතිමාව වන උරුසිලා පටිමා නොවන බව නිගමනය කර ගත හැකි විය. ශ්‍රී ලංකාවේ නිර්මාණික පළමු බුදුපිළිමය උරුසිලා පටිමාව නම් ප්‍රතිමාව බව පර්යේෂණය තුළින් තහවුරු විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

වික්‍රමගේ, එච්., (1964). ***රජරට සංස්කෘතික උරුමය.***

සෝමපාල, ජයවර්ධන, පී. (1996). ***සිංහල දේශික විශ්වකෝෂය.*** ගොඩගේ සහ සහෝදරයෝ.